# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2109/22 – 2019 පෙබරවාරි 08 වැනි සිකුරාදා– 2019.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 22 දරන ආඥාව**

*මගේ යොමු අංකය* : 4 - 3/9/2016/ඩබ්ලිව්එස්/555.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*:
කේඩීඑස්/කේජීකේ/4/2/2016/02/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තරව ඇති පරවශ්‍යතාවයට යටත්වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජනවාරි මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ අම්පිටිය උඩගම උතුර 269 සහ තැන්නේකුඹුර 275 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙමනේරිය වත්ත සහ තැන්නේකුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/එම්එච්එන්/2017/262 හා 2017.09.14 දිනැති **ප්‍රගමණ අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:**

2. **පරවශ්‍යතාවේ විස්තරය.–** කුණ්ඩසාලේ හාරගම ජලසම්පාදන ව්‍යාපෘතියෙ තැන්නේකුඹුර සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා පරවශතාවය අත්කර ගැනීම.

1. **කැබලි අක්ෂර 'ඒ ' – සෙමනේරිය වත්ත – ප්‍රමාණය: හෙක්.0.0116 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත; නැගෙනහිරට: ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත, ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත සහ කැබලි අක්ෂර බී; දකුණට: ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත; බටහිරට: ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

2. **කැබලි අක්ෂර 'බී' – තැන්නේකුඹුර වත්ත – ප්‍රමාණය: හෙක්.0.0192ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ, ඩී. එම්. ජයතිලක හිමිකම් කියන සෙමනේරිය වත්ත සහ ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම්




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කියන තැන්නේකුඹුරවත්ත; නැගෙනහිරට: ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත; දකුණට: ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත; බටහිරට: ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් හිමිකම් කියන තැන්නේකුඹුර වත්ත, ඒ. එම්. විජිත බණ්ඩාර හිමිකම් කියන සෙමනේරිය වත්ත.

02 - 818

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

*මගේ අංකය* : 4 - 3/9/2016/ඩබ්ලිව්එස්/555.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*:
කේඩීඑස්/කේජීකේ/4/2/2016/02/03.

1972 අංක 18 සහ 1974 අංක 29 දරන අර්ථ නිරූපණ (සංශෝධිත) පනත් වලින් සංශෝධිත අර්ථ නිරූපන ආඥාපනතේ (12 වන අධිකාරිය) 18 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම අංක 2089/48 හා 2018.09.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4 ඒ පිටුවේ පළකරන ලද ''2018 අංක 212 දරන ආඥාව'' මෙයින් අවලංගු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජනවාරි මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 819

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.